# මී මැසි පාලනය

ලංකාවේ සිටින මීමැස්සෝ පැහැදිලිවම වර්ග සතරකි. මෙයින් හීලෑ කිරීමට ඉතා ලෙහෙසිවූද, මනුෂ්‍යයාට ඉතාම ලාභ ගෙන දෙන්නාවූද වර්ගය මීමැස්සාය. මෙම සතර වර්ගයෙන් එක් එක් ජනපදයක් රැජිනියකින්ද, පිරිමි මැස්සන් ගෙන්ද, වැඩකාර මැස්සන්ගෙන්ද, සමන්විත වේ.

මීමැස්සා සිරිතක් වශයෙන් උගේ වද බඳින්නේ, ගස්බෙන්වල කුඩා ගල් බෙන්වල, ලී ගොඩවල්වල හා මැටි භාජන තුළය.

ජනපදයේ ශක්ති ප්‍රමාණයත්, පිහිටීමත් අනුව, වද එකක් හෝ වැඩි ගණනක් බඳිනු ලැබේ.



ගස්වල හා ගල්වල ආවරණය නුවූ ස්ථානවල එක් වදයක් පමණක් බමරුන් හා දඬුවැල් මැස්සන් විසින් බඳිනු ලැබේ. එබැවින් උන් මීමැසිපෙට්ටි වල හීලෑ කිරීම උගහට ය.

පොලොවේ ඇති කුඩා කුහරතුළ හා ලී ගස්, ගල් හා බිත්ති ආදියෙහි ඇති සිදුරු තුළ කනෙයි මැස්සෝ වද සාදති. වදය කොත්තමල්ලි ඇටයක් වැනි ඇට රාශියකින් සමන්විතවූ එකක් මෙනි.

ලංකාවට වරින්වර පිටරට වලින් මීමැස්සෝ ගෙන්වා ඇත. එයින් ප්‍රධාන තැන ගන්නේ ඉතාලි මැස්සාය. මෙරට මීමැස්සා, පිටරට මීමැස්සා සමඟ සිරිත් විරිත් වලින් සමාන වූවද, පිටරට මැස්සා විශාල වූද, වර්ණයෙන් තරමක් වෙනස් වූද සතෙකි. විශේෂඥයන්ගේ, අදහස් අනුව, ඉතාලි මැස්සා, අඩුවෙන්ම අනින වැඩියෙන්ම මීපැණි නිෂ්පාදනය කරණ ඇති කිරීමට ලෙහෙසිම සතා ය.

දේශීය මීමැස්සා, ලංකාවේ ඕනෑම පළාතක සිටී. මීපැණි නිෂ්පාදනය කරණ ප්‍රමාණයෙන්ද දළයෙහි ඇති විෂ ප්‍රමාණයෙන්ද වර්ණය හා ප්‍රමාණය ආදීන්ගේ වෙනසින්ද, ඔවුන්ගේ වර්ග වෙනස් වේ. කැලෑවල ස්වභාවිකව ඇතිවෙන මැස්සන්ගේ පැණි ප්‍රමාණයට වඩා විද්‍යානුකූලව සෑදූ මීපැණි පෙට්ටිවල ඇති කරණ මීමැස්සන්ගේ පැණි ප්‍රමාණය 3–4 ගුණයක් වැඩි වේ.

සමහර මීමැස්සෝ උන්ගේ වද, වහල සීලින් රීප්ප හා පරාල වැනි ආවරණයක් නොමැති ස්ථානවල බඳිති.

මෙම මීමැස්සෝ හීලෑ කිරීම අපහසු වන අතර උන් පෙට්ටි අත්හැර පුරුදු ස්ථානවලට සිරිත් වශයෙන් සෑම කල්හිම යති. රැජින රඳවා ගැනීම සඳහා ගාඩ් කැබලි (දෙරටුපාලක කැබෙලි) සවිකළ කල්හී පවා උන් රැජින අතහැර සමූහ වශයෙන් පියඹා යති.

මීමැස්සා ඉතා තියුණු ශ්‍රවන දෘෂ්ඨී හා ආඝ්‍රාන ශක්තියක් ඇති ඉතා උද්යෝගී බුද්ධිමත් කෘමියෙකි. ඌ අති මිහිරි, ඉතා රසවත් ආහාරයක් වන මීපැණි නිෂ්පාදනය කරයි. සාමාන්‍ය විශ්වාසයට පටහැනිව කුපිතකිරීමක් නොමැතිව ඌ දෂ්ට නොකරයි. අති පිරිසිදු කෘමියෙක් බැවින් මනුෂ්‍ය ශරීරයේ දහඩිය සුවඳින්, ලෙහෙසියෙන්ම කුපිත වී ඌ දෂ්ඨ කිරීමට පෙළෙඹෙයි.

එබැවින් මනුෂ්‍ය ශරීරයේ දහඩිය නොමැති දවසේ අළුයම් කාලයේ හෝ සවස් භාගය, මීමැසි ජනපද අතපත ගෑමට ඉතා සුදුසු කාලය වේ.

මීමැසි ජනපදයක් රජ මැස්සියකින්ද, පිරිමි මැස්සන්ගෙන්ද, වැඩකාර මැස්සන් ගෙන්ද සමන්විත වේ. රැජින ජනපදයේ නායිකාව වන අතර එහි සිටින සෑම මීමැස්සෙකුගේම මව් වේ. රැජිනක් නොමැතිව ජනපදයක් පිහිටුවිය හැකි නොවේ. ඇගේ මූලික කටයුත්ත බිත්තර දැමීම ය. ඇ රතු පාටට හුරු කහපාට, පිරිමි හා වැඩකාර මැස්සන්ට වඩා ප්‍රමාණයෙන් විශාලවූත්, කුඩා පිහාටු දෙකක් ඇති කෘමියෙකි. ඇගේ ඔළුව වැඩකාර මැස්සාගේ ඔළුවට සමාන මුත් ඊට වඩා සුළු වශයෙන් රවුම් ය. ඇට දළහක් ඇතිමුත්, එය පාවිච්චි කරන්නේ වැඩිමනත් ඇති රජ පිළව් ඇති කාමර විනාශ කිරීමට හා වෙනත් රැජිනක් සමඟ සටන් කිරීමට ය.

පිරිමි මැස්සන්ට විශාල ඔළුවක් ඇති අතර අති විශාල ඇස්, හිස් මුදුනේදී සමුවන අතර එයින් මුහුණට වටකුරුවූ හැඩයක් ගෙන දෙයි. උන්ගේ පස්සා පැත්ත වටකුරු වන අතර දළහක් නොමැති ය. අනිත් දෙවර්ගයට වඩා පිරිමි මැස්සන්ගේ පිහාටු පළල්වූ විශාල ඒවා වෙති. රැජින සමඟ සංවාසයෙහි යෙදී ම උන්ට ඇති එකම කාර්‍යය වේ. කලාතුරකින් විනා නිත්‍ය වශයෙන්ම මෙය සිදු වන්නේ රැජිනගේ ජීවිත කාලයේ එක් අවස්ථාවක පමණක් වන අතර ඒ සඳහා එක් මැස්සෙකුගේ සේවයට වඩා කිසිකලෙක අවශ්‍ය නොවේ. උන්ගේ ඇඟ තද කළුපාට වන අතර සියුම් ලොම් රාශියකින් වැසී තිබේ. මල්පැණි එකතු කිරීම සඳහා ඌට අවයව නොමැති අතර ඌ ඉතා කම්මැලි කෘමියෙකි. ජනපදයක වැඩිහරියක් වෙසෙන්නේ වැඩකාර මැස්සන් ය. ගැහැණු වර්ගය වූවාට උන් සාමාන්‍යයෙන් වර්ගය බෝකිරීමේ නොයෙදේ. රැජිනගේ කාමරය වටා ඉපදෙන ගැහැණු මැස්සන්ට බිත්තර දැමීමේ ශක්තිය ඇතිමුත්, එම බිත්තර වලින් ඉපදෙන්නේ පිරිමි සතුන්ම ය.

රැජිනක් සිටින ජනපදයක, වැඩකාර මැස්සෙක්, බිත්තර දමනවා අසුවුවහොත් අනික් වැඩකාර මැස්සන් විසින් කිසිම දයාවක් නොමැතිව ඌ මරා දමනු ලැබේ.

ජනපදයේ ඇති සෑම වැඩකටයුත්තක්ම කරණු ලබන්නේ වැඩකාර මැස්සන් විසිනි. වද සෑදීම මීපැණි හා ඉටි සැපයීම, ජලය ගෙන ඒම පැටවුන්ට ආහාර සැපයීම හා මැරුණු මැස්සන් එළියට ඇද දැමීමෙන්ද ජනපදයට සතුරන් විසින් කරණ ප්‍රහාර වලක්වාලීම ආදියෙන් ජනපදයේ සාමාන්‍ය සනීපාරක්ෂාව රැක ගැනීමද උන්ට අයිති ය.

වැඩකාර මැස්සිය පෙනීමෙන් රැජිනට සමාන වුවද, ඊට වඩා කුඩා ය. ඇයට උල්වූ පස්සා පැත්තක් ඇති අතර පිහාටු තරමක් විශාලය. උගේ දලගය පසුපස පිහිටා ඇත. වැඩකාර මැස්සියට ඉතා සංකීර්ණ පාද යුගල තුනක් තිබේ. එක පාදයක කොටස් නවයක් ඇති අතර සන්ධි ස්ථාන අටක් තිබේ. ඒවා උකුලද, ශබ්ද නගන කොටසද, කලවයද කෙන්ඩ හා පාදයද වේ. පස්වැනි කොටස වූ පාදය තවත් අතුරුකොටස් 5කට බෙදේ.

මෙයින් පළමුවෙනි අතුරු කොටස අනික්වාට වඩා විශාල වූද, ඇතුළු පැත්තේ ලඟි ලඟින් පිහිටා තිබෙන පේලිවල පිහිටි ''පරාග බුරුසු'' නමින් හැඳින් වෙන රළු ලොම් වලින් යුක්තය. මල්වලට ගොස් පැමුණුන විට බඩේ තැවරී ඇති පරාග පිස දැමීම කරනු ලැබේ. කකුලෙහි අන්තිම අතුරු කොටස නැමුණු නිය දෙකක් තිබේ. එම නිය වලින් දැව පොතු හා පත්‍ර වැනි රළු ද්‍රව්‍ය වල සුරක්ෂිතව පාද තැබීමට අවස්ථාව ලබා දෙයි.